**දිස්ත්‍රික් ක්‍රමසම්පාදන ලේකම් කාර්යාලය - හම්බන්තොට**
மாவட்ட கொள்கைத் திட்டமிடல் செயலகம் - ஹம்பாந்தோட்டை
District Planning Secretariat - Hambantota

පළමු මහල, මාගම් රුහුණුපුර පරිපාලන සංකීර්ණය, සිරිබෝපුර, හම්බන්තොට, 1ஆம் மாடி, ருஹுணு மாகம்புர நிர்வாக கட்டிடத் தொகுதி, சிறிபோபுர, ஹம்பாந்தோட்டை. 1st Floor, Magam Ruhunupura Administrative Complex, Siriboopura, Hambantota


"සෞභාග්‍යමත් අනාගතයක් උදෙසා"
"சௌபாக்கியமான எதிர்காலத்திற்காக"
*" For a prosperous future"*

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இலக்கம் / My No | : DSH/DPS/05/Gamperaliya.COM(Tem)/2019 | ඔබේ අංකය / உமது இலக்கம் / Your No | : | දිනය / திகதி / Date | : 2019.12. |

ප්‍රාදේශීය ලේකම්,

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,

කටුවන/වලස්මුල්ල/වීරකැටිය/ඕකෙවෙල/බෙලිඅත්ත/තංගල්ල/අඟුණකොළපැලැස්ස/

අම්බලන්තොට/හම්බන්තොට/සූරියවැව/තිස්සමහාරාමය/ලුණුගම්වෙහෙර

**<u>2019 සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය වාර්තා කිරීම</u>**

2019 වර්ෂය තුළ විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ඔබ වෙත ප්‍රතිපාදන ලබා දී ඇති අතර එකී ප්‍රතිපාදන වලට අදාලව එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ භෞතික හා මූල්‍ය ප්‍රගතිය **ඇමුණුම් අංක 01** ලෙස දක්වා ඇති ආකෘති ප්‍රකාරව නිවැරදි තොරතුරු 2020.01.03 දිනට හෝ ඊට පෙර පහත සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය හා ෆැක්ස් අංකය මඟින් ලබා දීමට අවශ්‍ය කටයුතු කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

විද්‍යුත් ලිපිනය : dpshambantota@gmail.com

ෆැක්ස් අංකය : 047-2256234

02. ඒ අනුව අංක 01 ආකෘතිය තුළ 2019 වර්ෂයේ නව වැඩ සඳහා ලබා දුන් ප්‍රතිපාදන පමණක් සඳහන් කළ යුතු අතර අංක 02 ආකෘතිය මඟින් 2018 වර්ෂයේ අඛණ්ඩ සහ අතැති බිල් සඳහා 2019 වර්ෂයේදී ලබා දුන් ප්‍රතිපාදන වලට අදාල ප්‍රගතිය ලබා දීමට කටයුතු කරන ලෙස දැනුම් දෙමි.

03. තවද ඒ ඒ වැය විෂයන්ට අදාලව ඔබ වියදම් කරන ලද පරිපාලන වියදම ද ව්‍යාපෘති වියදමට ඇතුළත් කළයුතු අතර මෙම ආකෘතීන්හි දක්වා නොමැති වෙනත් අමාත්‍යාංශ මඟින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් ඇත්නම් එකී වැඩසටහන්ද මෙම ආකෘතීන්ට ඇතුළත් කරන ලෙස දන්වන අතර මෙම ආකෘතීන් www.dpshambantota.info යන වෙබ් අඩවියෙන් භාගත කර ගත හැකි බවද දන්වමි.

04. ඒ අනුව මෙම ආකෘති ප්‍රකාරව සාරාංශ තොරතුරු 2020.01.03 දිනට වාර්තා කිරීමට අමතරව එකී ව්‍යාපෘතිවල ප්‍රගති වාර්තා මීට පෙර ඉදිරිපත් කරන ලද ආකෘතිවලට අනුව 2020.01.06 දින හෝ ඊට පෙර ලබා දීමට අවශ්‍ය කටයුතු කරන ලෙස කාරුණිකව දැනුම් දෙමි.

එම්.බී.චන්ද්‍ර නිමල්
අධ්‍යක්ෂ ( ක්‍රමසම්පාදන )
හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් වෙනුවට


**දිස්ත්‍රික් ලේකම්**/District Secretary - 047-2256235 **අතිරේක දි.ලේකම්** / Addi.Dist.Sec - 047-2256232 **අධ්‍යක්ෂ(සැලසුම්)** / Director(Planning) - 047-2256234
**ස. අධ්‍යක්ෂ(සැලසුම්)** / A.D(Planning) - 047-2256319, 2256268, 2256150 **කාර්යාලය**/Office - 047-2256234 **ෆැක්ස්** / Fax - 047-2256150
**වෙබ් අඩවිය** / Web site : www.dpshambantota.info **ඊ-මේල්** / email : dpshambantota@gmail.com , feedback@dpshambantota.info